**රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2017**

-----------------------------------------------------------------------

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------------------------------------------------------

(i) ප්‍රමිතය ප්‍රකාරව කිසියම් අස්තිත්වයක වත්කම් එම අස්තිත්වයේ වත්කම් ලෙස සැලකීමට නම් ඒවා එම අස්තිත්වය විසින් පාලනය කළ යුතු අතර අස්තිත්වයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රයෝජනවත් විය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම්වල ධාරණ වටිනාකම රු.114,015,071 ක් ලෙස වාර්තා කර තිබුණද, එම වත්කම් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා නොකොට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් එහි මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය. එහෙත් එම වත්කම්වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස රු.31,545,264 ක් අරමුදලේ ආදායම් ප්‍රකාශනයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 21 (ඉ) ප්‍රකාරව අස්තිත්වයක අනුමත කළ අයවැය ලේඛනයක් නිකුත් කර ඇත්නම් අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස දැක්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය ගත තොරතුරු අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

------------------------------------------------------------------------------------------

ප්‍රමිතය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සම්බන්ධව හෙළිදරව් කිරීම් කළ යුතු වුවත්, පූර්ව වර්ෂයේ රූපවාහිනී යන්ත්‍ර සඳහා නිශ්චය කර තිබුණු අවුරුදු 03 ක ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචිත වර්ෂයේ අවුරුදු 05 ක් දක්වා වැඩි කර තිබීම හේතුවෙන් ක්ෂය ප්‍රතිශතයද සියයට 33 1/3 සිට සියයට 20 දක්වා අඩු වී තිබුණි. මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන තුළ අදාල හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 - දේපළ පිරියත හා උපකරණ
--------------------------------------------------------------------------------
ප්‍රමිතයේ 13 වන ඡේදය ප්‍රකාරව රු.349,000 ක් වූ පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස වෙන්ව වර්ගීකරණය නොකර පරිගණක ගිණුම යටතේ ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**
-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රේගුවේ සහ මෙම අරමුදලේ පරිහරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.1,603,625 ක් වටිනා ලිපි ද්‍රව්‍යවලින් අරමුදලේ කටයුතු සඳහා අදාළ වන ලිපි ද්‍රව්‍යවල පිරිවැය සහ වර්ෂය අවසානයට පැවති තොගයේ පිරිවැය වෙනම හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව සම්පූර්ණ පිරිවැයම අරමුදලේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) විගණන නියැදි පරීක්ෂාවට අනුව, රේගු ත්‍යාග මුදල් ගණනය කිරීම සඳහා යොදා ගනු ලැබූ විමර්ශන ලිපිගොනු 05 කට අදාලව කළමනාකරණ හා වන්දි අරමුදලට අයවිය යුතු ආදායම ගණනය කිරීමේදී, ඇති වී තිබුණු වැරදි හේතුවෙන් අරමුදලේ ආදායම රු.3,359,985 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) රේගු ආඥා පනතේ 153 වගන්තිය අනුව දණ්ඩන හා රාජසන්තක කල භාණ්ඩ විකුණුම් ආදායමින් රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක්ද, කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා සියයට 20 ක්ද වශයෙන් දායක වුවද, රේගු ත්‍යාග අරමුදලේ ආදායම් ලෙස හඳුනාගෙන තිබූ නමුත්, ඊට සමානුපාතිකව කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා ආදායම් ලෙස රු.31,520,337 ක් හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් කාණ්ඩ 04 ක් සඳහා රු.254,706 ක් වැඩියෙන් හා කාණ්ඩ 02 ක් සඳහා රු.172,143 ක් අඩුවෙන් ක්ෂය ගණනය කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දණ්ඩන හා රාජ්‍යසන්තක කල භාණ්ඩ විකුණුම් ආදායමින් සියයට 50 ක් ලෙස සමාලෝචිත වර්ෂයට අදාළව රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කර ඇති රු.2,316,128,767 ට සාපේක්ෂව සියයට 20 ක් ලෙස මෙම අරමුදලට ලැබිය යුතු රු.926,451,507 ක මුදල වෙනුවට රු.918,440,564 ක ආදායමක් පමණක් මෙම අරමුදලට බැර කර තිබුණි. ඒ අනුව අරමුදලට අඩුවෙන් බැර වූ ආදායම රු.8,010,943 ක් විය. එහෙත් එම වෙනසට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ආ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අනුව විදේශ පුහුණු , දේශීය පුහුණු හා පශ්චාත් උපාධි පුහුණු යන වියදම් විෂයයන්වල අදාල වටිනාකම් සහ ඒවාට අදාල ලෙජර් ගිණුම්වල පැවති අගයන් අතර පිළිවෙලින් රු.1,556,281 , රු.1,249,234 ක් හා රු.410,125 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඇ) අරමුදලේ සමුච්චිත ශේෂය යටතේ භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වූ ශේෂයන් අතර සමාලෝචිත වර්ෂය ආරම්භයට රු. 462,120 ක හා අවසානයට රු. 2,335,549 ක වෙනසක් විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සිදු කරන ලද රු.14,541,567 ක ක්ෂය ගැළපීමට අදාළ විස්තරාත්මක පැහැදිළි කිරීම් විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර ඒ සඳහා විස්තරාත්මක උපලේඛනයක්ද විගණනය වෙත ඉදිරිපත් නොවිය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ අතිරික්තය රු.728,808,304 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.727,612,118 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,196,186 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමස්ත වියදම රු.19,376,952 කින්ද අරමුදලේ සමස්ත ආදායම රු.18,180,766 කින්ද පහළ යාම මීට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා වූ නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැලසුම් කිරීමකින් තොරව මෙම අරමුදලට මුදල් වෙන් කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5,420 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 6,164 ක් දක්වා රු.මිලියන 744 කින් හෙවත් සියයට 14 කින් වර්ධනය වී තිබුණු බව නිරීක්ෂණය විය. එනම් සමාලෝචිත වර්ෂයේ ආදායමින් සියයට 81 ක්ම අරමුදල තුල සමුච්චනය වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ ආදායම රු.මිලියන 918 ක් වුවද අරමුදලේ මූලික අරමුණු වෙනුවෙන් වැය කර ඇති මුදල ආසන්න වශයෙන් රු.මිලියන 134 ක් විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායමද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීමත් එම දණ්ඩනය පදනම් කරගෙන නිලධාරීන්ගේ ත්‍යාග තීරණය කිරීමත් හේතුවෙන්

නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් සිදු වී තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල වෙනුවෙන් භාණ්ඩාගාරයේ පවතින තැන්පතු ගිණුමින් භාණ්ඩාගාරය විසින් වැයකර තිබූ එකතුව රු.37,708,104 ක මුදලක් එම අරමුදල යටතේ හෝ ශ්‍රී ලංකා රේගුව යටතේ පවතින වෙනත් මූල්‍ය ප්‍රකාශනයක හෝ ඇතුලත් කර නොතිබුණි. කෙසේ වුවද, මෙම වැය ශ්‍රී ලංකා රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට අදාල වියදම් නොවන අතර රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත දැරිය යුතු වියදම් බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) රේගු දෙපාර්තමේන්තුවේ වැය විෂය අංක 01.01.1203 යටතේ දැරිය යුතු වන නිල ඇඳුම් වියදම්ද කළමනාකරණ හා වන්දි අරමුදල යටතේ දරා තිබුණි. ඒ හේතුවෙන් අරමුදලේ ඉකුත් වර්ෂයේ රු.312,825 ක් වූ නිල ඇඳුම් වියදම සමාලෝචිත වර්ෂයේදී රු.7,527,280 ක් දක්වා සියයට 2306 කින් වර්ධනය වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය පාලනය**

අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍ර 02 ක වන දණ්ඩන ආදායම හා රාජසන්තක කළ භාණ්ඩ විකුණුම් ආදායම සඳහා පිළිවෙලින් සියයට 51 ක හා සියයට 95 ක විචලනයක් පැවති බව අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා සැසඳීමේදී නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) විදේශ පුහුණු | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව විදේශ පුහුණු කටයුතු සඳහා නිලධාරීන් තෝරා ගැනීම. |
| (ආ) ආදායම් රැස් කිරීම | අරමුදලට ලැබිය යුතු ආදායම් හා ලැබී ඇති ආදායම් සැසඳීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම. |

| | |
|---|---|
| (ඇ) ගිණුම්කරණය හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම | විධිමත් ද්විත්ව සටහන් ක්‍රමයකට අනුගත නොවී ලෙජර් ගිණුම් පවත්වා ගෙන යාමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලට තොරතුරු ලබා ගැනීම. |
| (ඈ) පාලන ගිණුම් පිළියෙල නොකිරීම | ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන ගිණුම සමඟ සම්බන්ධ ගනුදෙනු සඳහා පාලන ගිණුමක් හරහා ගනුදෙනු සටහන් නොවීම. |